# 7. කන්ද උඩ දේශනයෙන් ජීවිතයට දිරියක්

**ජේසුස් වහන්සේ වදාළ කන්ද උඩ දේශනයේ ඉගැන්වීම් කීපයක් අධ්‍යයනය කරමින් ඒ හරහා කිතුනු ජීවිතයට ලබාගත හැකි මග පෙන්වීම් විමසා බැලීම මෙම පාඩමින් අපේක්ෂිත ය.**

**ශු. මතෙව් 5: 13-16, 7: 12**

ජේසුස් වහන්සේගේ ඉගැන්වීම්වල තිබූ සාරවත් භාවය නිසා උන් වහන්සේට සවන් දෙන පිණිස, උන් වහන්සේ වටා දහස් ගණන් ජනයා එක්රැස් වූ ආකාරය ශුද්ධ වූ ශුභාරංචියෙන් අපට දැනගත හැකි ය.

✽ උන් වහන්සේ ඉගැන්වීම් සඳහා තෝරාගනු ලැබුවේ බොහෝ දෙන සහභාගි විය හැකි නිශ්චල ස්වාභාවික ස්ථාන බව පැහැදිලි වෙයි.

ඒවා නම්:

- කඳු මුදුන්
- මිටියාවත්
- මුහුදු වෙරළ වැනි විවෘත ස්ථාන මෙන් ම සාමාන්‍ය ජනතාව වෙසෙන ඉඩකඩ ඇති නිවාස ද වේ.

✽ උන් වහන්සේගේ ඉගැන්වීම් ඉතා සරල හා ජීවිතයට සමීප නිසා ඒවාට සවන් දීමට උන් වහන්සේ වෙත බහුලව පැමිණියේ සාමාන්‍ය ජනතාව යි. ඉතා දුගී, සමාජය විසින් ප්‍රතික්ෂේප කරන ලද එමෙන් ම දේව මාලිගයට හෝ ධර්මශාලා වෙත යෑමට අවසර නොලත් අයකැමියන්, කාන්තාවන්, දරුවන්, රෝගීන්, දිළිඳුන් වැනි ජන කොටස් නිරතුරුව ම උන්වහන්සේ වටා එක්රොක් වූහ. උන් වහන්සේගේ ආදරය හා දයානුකම්පාව නො මඳව ඔවුනට හිමි විය.

✽ ජේසුස් වහන්සේගේ දේශනය හා ඉගැන්වීම් සඳහා බොහෝ විට යොදා ගනු ලැබුවේ එදිනෙදා ජුදෙව් සමාජයේ පැවති දේ ය. බැටළුවන්, අබ, ලුණු, දැල්වූ පහන්, මිදිවතු, අත්තික්කා ගස් වැනි ඉතා සරල, සාමාන්‍ය, ස්වාභාවික නිදසුන්වලින් උන් වහන්සේගේ ඉගැන්වීම් සැම දෙනාට සමීප වූ බව වැඩිදුරටත් පැහැදිලි ය.

## ජේසුස් වහන්සේගේ කන්ද උඩ දේශනය පිළිබඳ ව ඔබ අසා තිබේ ද?
**(ශු. මතෙව් 5-7 පරිච්ඡේද)**

ජේසුස් වහන්සේගේ ශ්‍රාවකයන් මෙන් ම බොහෝ ජනකායක් මෙම දේශනය ඇසීමට උන් වහන්සේ වෙත කඳු මුදුනට ආහ. කිතුනු ජීවිතය ගෙනයාමේ දී ඉතා වැදගත් වන මග පෙන්වීම් සහ ඉගැන්වීම් කන්ද උඩ දේශනය තුළින් ජනතාව වෙත ලැබිණි.

## යහපත් කිතුනු ජීවිතයක් ගතකිරීම සඳහා කන්ද උඩ දේශනයෙන් මග පෙන්වීම් කීපයක් දැන් අපි ලබා ගනිමු.

### (1) රන් අණ තුළින් කිතුනු ප්‍රේමය සවිමත් කර ගනිමු.

**"අනුන් ඔබට යමක් කරනවාට ඔබ කැමති ද, ඔබත් ඒ දේ ම ඔවුන්ටත් කරන්න. ව්‍යවස්ථාවලියේ හා දිවැසාවලියේ හරය එය වේ."**
**ශු. මතෙව් 7: 12**

රත්තරන් ඉතා වටිනා ලෝහයකි. ඉන් සාදන ආභරණ, කාසි ආදි දෑ හිමි කර ගැනීමට කිසිවෙක් අකමැති නො වෙති. එයට හේතුව නම් රන් ඉතා අගනා, මිල අධික ද්‍රව්‍යයක් වන බැවිනි.

අන් අය අපට සලකනවාට අප කැමති ද ඒ ආකාරයෙන් ම අපත් ඔවුනට සැලකිය යුතු බව ජේසුස් වහන්සේ අවධාරණය කළ සේක. රන් අණ යනුවෙන් හඳුන්වන්නේ මෙයයි. අන් අය ඔබට කෙසේ සලකනවාට ඔබ කැමති ද ?



- ගෞරවයෙන්,
- සවන්දීමෙන්,
- ආදරයෙන්,
- බෙදාගැනීමෙන්,
- එක සමානව සැලකීමෙන්,
- අවංකව,
- පොරොන්දු ඉටු කිරීමෙන්,
- අවශ්‍යතාවේ දී මිතුරකු වීමෙන්.

ඔබ කැමති ද?

රන් අණ පිළිපදින්නට?

ඒ තුළින් ඔබේ දිවියට නව අරුතක් ලබාගන්නට?

යහපත් වූ වටපිටාවක් ඇති කරන්නට?

## (2) පොළොවේ ලුණු මෙන් වැය වීමේ සේවයක යෙදෙමු.

අපේ එදිනෙදා ජීවිතයට ලුණු අත්‍යවශ්‍ය දෙයකි. එය සෑම නිවසක ම භාවිත වන්නකි.

- ❊ ආහාර රසවත් කරයි.
- ❊ රසය වෙනස් කරයි.
- ❊ විෂබීජ නාශකයක් ලෙස ක්‍රියා කරයි.
- ❊ ආහාර කල්තබා ගැනීමට උපකාර වේ.
- ❊ ආහාරයට එක් කළ පසු දියවී යයි.

**"ඔබ පොළොවේ ලුණු ය"**
**ශු. මතෙව් 5: 13**

යි කීමෙන් ජේසුස් වහන්සේ අදහස් කළේ කුමක් ද ?

### ලුණු ආහාර රසවත් කරයි.

ඔබ පොළොවේ ලුණු නම්;

අන් අයගේ ජීවිත රසවත් කිරීමට අප ක්‍රියා කළ යුතු වේ. දුකින්, වේදනාවෙන්, පීඩාවෙන්, පාපයේ ඇලී ගැලී ජීවත් වන අයට සහනයක් හා ප්‍රබෝධයක් ලබා දීමට ක්‍රියා කිරීම කිතුනුවන් වන අප සැමගේ වගකීම යි.

### ලුණු, රසය වෙනස් කරයි

ඔබ පොළොවේ ලුණු නම්;

එහි ඇති ලුණු ගතිය වෙනත් දෙයකින් දිය නො හැකි ය. ඒ නිසා ලුණුවල ඇති රසය එයටම ආවේණික රසයකි. පාවිච්චි කරන විට ඒ ලුණු, රස වෙනස් කිරීමට සමත් වෙයි. එමෙන් අප ද අපගේ ජීවිතවලට දෙවියන් වහන්සේ ලබා දී ඇති සුවිශේෂ යහපත් ලක්ෂණවලින් අන් අයගේ ජීවිතවල ඇති වැරදි ජීවන රටා වෙනස් කිරීමට අපට හැකියාව තිබිය යුතුය.

## ලුණු, විෂබීජ නාශකයක් ලෙස ක්‍රියා කරයි.

ඔබ පොළොවට ලුණු නම්;

ඔබ දිවි ගෙවන සමාජයේ පවතින අයහපත් හා වැරදි දේට එරෙහිව ක්‍රියා කළ යුතු ය. එලෙස ම අන් අයගේ ජීවිතවල පවතින වැරදි, අයහපත් ක්‍රියා හා පාප නසා දැමීමට ලුණු මෙන් ක්‍රියා කළ යුතු ය.

## ලුණු ආහාර කල්තබා ගැනීමට උපකාර වේ.

ඔබ පොළොවේ ලුණු නම්;

ලුණු ගතිය සමාජයේ යහ පැවැත්මට භාවිත කළ යුතු වෙයි. අප වටා පවතින කුරිරු සහ නපුරු දේ මෙන් ම අප වරදට ඇද දමන කාරණාවලින් අප විනාශ වීම වළක්වා අපගේ ලුණු ගතිය භාවිතා කරමින් අන් අයගේ ජීවිත සුරක්ෂිත කිරීමට යුහුසුලු විය යුතු වෙයි. සමාජයේ යහපැවැත්ම පවත්වා ගැනීමට ක්‍රියා කළ යුතු ය.

## ලුණු යමකට එක් කළ විට දියවේ.

ඔබ පොළොවේ ලුණු නම්;

ලුණු දියවීමෙන්, එහි ප්‍රයෝජනය වැඩි වෙයි. ජේසුස් වහන්සේ ද අපෙන් අපේක්ෂා කරන්නේ එය ම ය. අප කුඩා වුවත් දෙවියන් වහන්සේගේ රාජ්‍යය පොළොවේ ක්‍රියාත්මක කරන්නට අපෙන් වන ප්‍රයෝජනය ඉමහත් ය. ඒ සඳහා අනිවාර්යයෙන් ම අපි ලුණු මෙන් වැය විය යුතු ය.

**"ලුනුවල ලුනු ගතිය නැති වුවහොත්**
**එයට ලුනු රස කවන්නේ කුමකින් ද?"**
**මතෙව් 5: 13**

දෙවියන් වහන්සේ අපට දී ඇති ලුණු ගතිය එනම් වටිනාකම් යම් හෙයකින් නැති වුවහොත් එය වෙනස් දෙයකින් පිරවිය නො හැක. ඒ නිසා ජේසුස් වහන්සේ අපට අණ කරන්නේ අප පොළොවේ ලුණු නම් දේව රාජ්‍යයේ වටිනාකම්, පවත්වා ගෙන යා යුතු බව යි.

## (3) ලෝකයේ ආලෝකය වෙමින් ජීවිත ඔපවත් කරමු.

රාත්‍රිය අන්ධකාරය උදා කරයි. රාත්‍රිය හමාර වන විට උදා වන හිරු අන්ධකාරය පහකරයි. මුළු පරිසරය ම ආලෝකවත් කරයි.

**ඔබ ලෝකයේ ආලෝකය ය.**
**ශු. මතෙව් 5: 14**

ජේසුස් වහන්සේ අප හඳුන්වන්නේ ලෝකයේ ආලෝකය ලෙස ය. ආලෝකයේ වටිනාකම හා වැදගත්කම අපේ ජීවිතවල අපි එදිනෙදා අත්දකිමු. ආලෝකයක් නොමැතිව අපට ජීවත් වීම අසීරු වෙයි. අන්ධාකරය පහකිරීමට කුඩා ආලෝකයක් වුවත් ප්‍රයෝජනවත් වන ලෙස ම අප ද ආලෝකයක් වුවහොත් අන්ධකාරය පහ කළ හැකි ය. ජේසුස් වහන්සේගේ ආලෝකය අප තුළින් විහිදීම උන් වහන්සේගේ කැමැත්ත වේ.

කඳු මුදුනක පිහිටා ඇති නගරයක ආලෝකය බොහෝ ඈතට විහිදෙයි. එමෙන් ම පහනක් දල්වා පහන් රුකක් මත තබන විට ඒ ආලෝකය අන්ධකාරය පහකොට විශාල පෙදෙසකට විහිදී යයි. එලෙස අපගේ ජීවිත වලින් ජේසුස් වහන්සේගේ ආලෝකය දිස්වන විට බොහෝ අය ඒ ආලෝකයෙන් ජීවිත ආලෝකවත් කර ගනිති.

එසේ දිරියෙන් යුතුව සේවය කිරීමෙන්, ලෝකයට ලුණු හා ආලෝකයක් මෙන් වැය වෙමින් අප ජීවත් වන වට පිටාවට සේවය කරමු.

### ක්‍රියාකාරකම

1. රන් අණ යෙදූ පොතේ සලකුණක් සාදා එය වර්ණවත් ලෙස අලංකාර කරන්න.
2. ඔබේ පන්ති කාමරය තුළ ඔබට ලුණු මෙන් විය හැකි අවස්ථා හා ආලෝකය ලෙස ක්‍රියා කළ හැකි අවස්ථා පෙළ ගස්වන්න.